කෙටි නාට්‍ය සඳහා විස්තර

# මිනිත්තු දෙකක කෙටි නාට්‍ය සඳහා විස්තර

පහසුකම් සලසන්නන් සඳහා උපදෙස්: පහත විස්තර කර ඇති අවස්ථා අතරින් ඔබේ සැසියට යොදාගැනීමට සුදුසු අවස්ථාව තෝරාගන්න. ඉන් එක් කණ්ඩායමකට පිටපත් 2-3 ක් බැගින් ලබාදීමට ප්‍රමාණවත් පිටපත් සංඛ්‍යාවක් සූදානම් කරගන්න.

4 වැනි සැසිය | අත්පත්‍රිකාව

කෙටි නාට්‍ය සඳහා විස්තර

සිදුවීම:

## වීදියේ සහ රැකියා ස්ථානයේ

කාන්තාවක් තම රැකියා ස්ථානයට ගමන් කරමින් සිටින්නීය. ඇය සිය සුළුතර ආගමික අනන්‍යතාවය පිළිබිඹු කරන ඇඳුම් ඇඳ සිටින්නීය. මගියෙක් ඇය ඇඳ සිටින ඇඳුම නිසා ඇයට හිරිහැර කිරීමට පටන් ගනියි. කිසිවෙක් ඇයට උදව් කරන්නේ නැත. ඇය පොලිස් නිලධාරියෙකු දැක උදව් ඉල්ලා සිටියි. හිරිහැර කරන්නා පැන ගියත් පොලිස් නිලධාරියා කිසිම ආකාරයකින් උදව් කරන්නේ නැත. ඇය සිය කාර්යාලයට පැමිණෙන අතර එහිදී තමන්ට ලැබුණු උසස්වීම සමරන කනිෂ්ඨ නිලධාරියකු ඇයට හමුවෙයි. මෙවර නැවතත් ඇයව උසස්වීම සඳහා සලකා බලා නැත.

**චරිත**

**අත්‍යාවශ්‍ය චරිත**: කාන්තාව, හිරිහැර කරන්නා, පොලිස් නිලධාරියා, මගියා, සගයා

**අමතර චරිත**: අමතර කාර්යාලීය සගයන් සහ මගීන්

සිදුවීම:

# වන්දනාමාන කරන ස්ථාන

කෙටි නාට්‍ය සඳහා විස්තර

ආගමික සුළුතර කණ්ඩායමක් ඉඩම් කොටසක් මිල දී ගෙන පූජනීය ස්ථානයක් ඉදිකිරීම සඳහා බලධාරීන්ගෙන් අවසර ලබා ගෙන තිබේ. ඔවුන් එම ස්ථානයේ ඉදිකිරීම් ආරම්භ කළත්, ඉදිකිරීම් නිරන්තරයෙන් කඩා බිඳ දමනු ලැබේ. ඔවුන් ඒ පිළිබඳව පොලිසියට හා පළාත් පාලන ආයතනවලට පැමිණිලි කළද, ඒ සම්බන්ධයෙන් කිසිවක් කළ නොහැකි බව එම ආයතන පවසයි. අවසානයේදී ඔවුන් එම ස්ථානය ඉදිකර ගත් නමුත් ඔවුන් වන්දනාමාන කිරීම සඳහා එහි යන සෑම අවස්ථාවකම බහුතර ප්‍රජාවේ මිනිසුන්ගේ හිරිහැර කිරීම් හා විවේචන වලට මුහුණ පායි.

**චරිත**

**අත්‍යාවශ්‍ය චරිත**: සුළුතර කණ්ඩායම් සාමාජිකයින් දෙදෙනෙක්, පොලිස් නිලධාරියෙක්, පළාත් පාලන ආයතනයේ නියෝජිතයෙක්, බහුතර කණ්ඩායමේ සාමාජිකයින් දෙදෙනෙක්

**අමතර චරිත**: සුළුතර සහ බහුතර කණ්ඩායම්වල සාමාජිකයින්

4 වැනි සැසිය | අත්පත්‍රිකාව

සිදුවීම:

# පාසලේදී ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස

කෙටි නාට්‍ය සඳහා විස්තර

සුළුතර ප්‍රජාවකට අයත් 12 හැවිරිදි පිරිමි ළමයෙක් රජයේ ප්‍රාථමික පාසලක අධ්‍යාපනය ලබන අතර අද සාමාන්‍ය පාසල් දිනයකි. බහුතර ආගමේ යාච්ඤාවන් සමග දවස ආරම්භ වන අතර ඔහු එම යාඥාවට සහභාගි විය යුතු වේ. යාච්ඤා කිරීමෙන් පසු ඔහු ඉතිහාසය පාඩමකට සහභාගී වෙයි. එහිදී ගුරුවරයා එම පිරිමි ළමයා අයත් වන සුළුතර ආගමික ප්‍රජාව ගැන නින්දා සහගත ලෙස කථා කරන පෙළ පොතකින් පාඨයක් කියවයි. පාඩමෙන් පසු විවේක කාලයේදී ඔහුගේ පංතියේ ළමයින් ඔහුගේ ආගමික අනන්‍යතාවය නිසා ඔහුට හිරිහැර කරන අතර, ඔහුව ක්‍රීඩා වලින් බැහැර කර තබයි.

**චරිත**

**අත්‍යාවශ්‍ය චරිත:** පිරිමි ළමයා, යාච්ඤා/ඉතිහාසය පාඩම පැවැත්වීමට ගුරුවරයෙක්, පංතියේ ළමයින් දෙදෙනෙක්

**අමතර චරිත:** අතිරේක ගුරුවරුන් සහ පංතියේ ළමයින්

සිදුවීම:

# පවුල තුළ ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස

කෙටි නාට්‍ය සඳහා විස්තර

17 හැවිරිදි ගැහැණු ළමයෙකුට ගුරුවරියක් වීම සඳහා පුහුණු වීමට විශ්වවිද්‍යාලයට යාමට අවශ්‍යයි. ඇයගේ දෙමව්පියන් ඒ සඳහා ඇයට ඉඩ දීම ප්‍රතික්ෂේප කරයි. ඒ වෙනුවට, ඔවුන්ට අවශ්‍ය වන්නේ පවුලේ ගරුත්වය ආරක්ෂා කිරීම සඳහා ඇයව විවාහ කර දීමටයි. භාර්යාවන්ගේ කාර්යභාරය නිවසේ කටයුතු කිරීම බැවින් ඔවුන්ගේ ආගමේ ගැහැණු ළමයින්ට අධ්‍යාපනය ලබාදීමට දිරිගන්වන්නේ නැතැයි ඔවුහු තර්ක කරති. ගැහැණු ළමයා මෙම විශ්වාසයන්ට එකඟ නොවන අතර ඇයට තමන්ගේ ම තීරණ ගැනීමට අවශ්‍යයි. බලහත්කාරයෙන් විවාහ වීමට බිය වූ ඇය නිවසෙන් පලා ගොස් වෙනත් නගරයක වැඩිහිටි ගැහැණු මිතුරියක් සමග නැවතී සිටින්නීය. ඇය අතුරුදහන් වූ බව ඇගේ පවුලේ අය පොලිසියට වාර්තා කරති. ඔවුන් ඇයව සොයාගත් විට පොලිසිය ඇයගේ කැමැත්තට එරෙහිව ඇයව දෙමාපියන් වෙත භාර දෙයි. ඊළඟ දවසේ දී මින් පෙර තමන්ට කිසිදිනක හමු නොවූ පිරිමියෙකු සමග විවාහ වන්නට ඇයට සිදු වන අතර නිවසින් පිටවීමට ද අවසර නොලැබෙයි.

**චරිත**

**අත්‍යාවශ්‍ය චරිත:** ගැහැණු ළමයා, ඇයගේ මව සහ පියා, මිතුරා, පොලිස් නිලධාරියා, දැරියගේ සැමියා

**අමතර චරිත:** අතිරේක පවුලේ සාමාජිකයින්, විවාහ මංගල්‍යයට සහභාගී වන පුද්ගලයින්, අතිරේක පොලිස් නිලධාරීන්

4 වැනි සැසිය | අත්පත්‍රිකාව

සිදුවීම:

# විවෘතව කථා කිරීම – දූෂණය සහ ප්‍රචණ්ඩත්වය

කෙටි නාට්‍ය සඳහා විස්තර

රජයේ විශ්වවිද්‍යාලයක ඉගෙනුම ලබන ශිෂ්‍යාවක් මහාචාර්යවරයෙකුගේ ලිංගික හිරිහැරයක් පිළිබඳව ශිෂ්‍ය පුවත්පතට වාර්තා කරයි. ශිෂ්‍ය මාධ්‍යවේදියෙක් මෙම සිද්ධිය පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රධානියා සමග සම්මුඛ සාකච්ඡාවක් පවත්වයි. විශ්ව විද්‍යාලයට මෙම කතාව වසන් කිරීමට අවශ්‍ය බැවින් ඔවුන් සමාජ මාධ්‍යවල කටකතාවක් පතුරුවා හරිමින් ශිෂ්‍ය මාධ්‍යවේදියා ආගමික විශ්වාස සහ ආගමික නායකයින් විවේචනය කර ඇති බව සඳහන් කරයි. ද්වේෂාපහාසය සම්බන්ධයෙන් ශිෂ්‍ය මාධ්‍යවේදියාට සහ පුවත්පතට චෝදනා කරමින් විශ්වවිද්‍යාලයේ දී උද්ඝෝෂණයක නිරත වීම සඳහා ප්‍රචණ්ඩකාරී මැර පිරිසක් රැස්වෙයි. විශ්ව විද්‍යාලය මෙය ශිෂ්‍ය පුවත්පත නවතා දැමීමට නිදහසට කරුණක් ලෙස භාවිතා කරයි. ද්වේෂාපහාස කිරීමේ සැකය මත පොලිසිය එම මාධ්‍යවේදියාව අත්අඩංගුවට ගනියි.

**චරිත**

**අත්‍යාවශ්‍ය චරිත:** ශිෂ්‍යාව, මාධ්‍යවේදියා, විශ්වවිද්‍යා, ප්‍රධානියා, මැර කණ්ඩායමේ සාමාජිකයන් දෙදෙනෙකු, පොලිස් නිලධාරියා

**අමතර චරිත:** මැර කණ්ඩායමේ සාමාජිකයන්